සාමාන්‍ය සමය තුන්වන ඉරුදින **දේව ප්‍රකාශන** 25-01-15

## පළමුවන දේව ප්‍රකාශනය

ජෝනා 3;1-5,10

ජෝනා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**(නිනීවේ වැසියෝ අදමිටු මගින් ඉවත් වූ හ.)**

සමිඳාණන් වහන්සේගේ පණිවුඩය දෙවන වරට ජෝනා වෙත පැමිණියේ ය. "නුඹ නැගිට නිනීවය නම් ශ්‍රේෂ්ට නගරයට ගොස් මා නුඹට කියන පණිවුඩය එහි ප්‍රකාශ කරන්නැ"යි සමිඳාණන් වහන්සේ වදාළ සේක. එවිට ජෝනා නැගිට සමිඳාණන් වහන්සේ නියම කළ පරිදි නිනීවයට ගියේ ය. නිනීවය ඉතා විශාල නගරයකි. එය හරහා යාමට දවස් තුනක් ගතවේ. ජෝනා නගරයට ඇතුල් වී, එක දවසක් ගමන් කර "තව දින සතළිසකින් නිනිවය වැනසෙනු ඇතැ"යි මෙරගසා ප්‍රකාශ කළේ ය. නිනීවයේ වැසියෝ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කර, උපවාසයක් නියම කොට, ලොකු අය පටන් කුඩා අය දක්වා දළ රෙදි ඇඳ ගත්තෝ ය. දෙවියන් වහන්සේ ඔවුන් කළ දේත් ඔවුන් නපුරු මාර්ගයෙන් ඉවත් වූ අයුරුත් දැක ඔවුන්ට කරන්නට අදහස් කළ විපත ගැන සිත වෙනස් කර ගෙන එය නොකළ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 25;4-9

ඔබගේ පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේගේ මාවත් මට පැහැදිලි කළ මැනව.

ගීය: සමිඳුනි, ඔබේ ක්‍රියා මාර්ගය මට හෙළි කළ මැනව. ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව. ඔබේ සත්‍යය අනුව මා ගෙන ගිය මැනව. මට එය ඉගැන්නුව මැනව.

මන්ද ඔබ මාගේ විමුක්ති දායක දෙවිඳාණෝ ය. දවස පුරා ඔබ එන මග බලා සිටිමි. සමිඳුනි, ඔබේ කරුණා ගුණයත් තිර පෙමත් සිහි කළ මැනව. මේවා ඔබේ චිරාගත ගුණාංගයෝ ය.

සමිඳුනි, මාගේ යොවුන් වියේ පාප ද අපරාධ ද සිහි නොකළ මැනව. සමිඳුනි, ඔබේ යහපත්කම ද මහා කරුණාව ද අනුව මා සිහි කළ මැනව.

සමිඳාණෝ යහපත් ය. අවංක ය. එතුමාණෝ පව්ටුන් හට යා යුතුසමිඳාණෝ යහපත් ය. අවංක ය. එතුමාණෝ පව්ටුන් හට යා යුතු මාර්ගය උගන්වන සේක. එතුමාණෝ නිහතමානි අය යුක්තියෙහි හසුරුවන සේක. එතුමාණෝ යටහත් පහත් අයට තම මාර්ගය උගන්වන සේක.

## දෙවන දේව ප්‍රකාශනය

1කොරින්ති 7:29-31

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**( මේ ලෝකයේ ස්වභාවය පහ වී යන්නේ ය.)**

සහෝදරවරුනි, මේ දේ කියනු කැමැත්තෙමි. එනම් වැඩි කාලයක් ඉතිරි වී නැත. මෙතැන් සිට භාර්යාවන් ඇත්තන් භාර්යාවන් නැත්තන් මෙන් ද, හඬන්නන් නොහඬන්නන් මෙන් ද, මිලයට ගන්නන් ගත් දෙයට අයිතියක් නැති අය මෙන් ද, මෙලොව සැප සම්පත් භුක්ති විඳින්නන් ඒවායේම ඇලී ගැලී නොසිටින්නන් මෙන් ද, සිටිය යුතු යයි මම ඔබට කියමි. මන්ද, දැන් පවතින මේ ලෝකය පහ වී යන්නේ ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

මාක් 1:15

ආලේලූයා! ආලේලූයා!
"දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්න ය; පසුතැවී සිත් හරවා ගන්න; සුබ අස්න අදහාගන්න"යි සමිඳාණෝ වදාරණ සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 1:14-20

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(ඔව්හු උන් වහන්සේ වැඩ වසන ස්ථානය දැක, එදින උන් වහන්සේ සමඟ නතර වූ හ.)**

ජොහන් හිරබාරයට ගනු ලැබූ පසු, ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ සුබ අස්න දේශනා කරමින් ගලීලයට වැඩිය සේක. ඒ දේශනාව මේ ය: "නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ; දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්න ය; පසුතැවී සිත් හරවා ගන්න; සුබ අස්න අදහාගන්න" යනුයි.

උන් වහන්සේ ගලීලයේ මුහුද අද්දර ඇවිදින විට සීමොන් ද ඔහුගේ සොහොයුරු ඇන්ඩෘ ද මුහුදෙහි දැලක් දමනු දුටු සේක. ඔව්හු මසුන් අල්ලන්නෝ වූ හ. ජේසුස් වහන්සේ ඒ දැක, "මා අනුව එන්න; මම ඔබ මිනිසුන් දිනාගන්නන් කරමි"යි වදාළ සේක. එකෙණෙහි ම ඔව්හු දැල් හැරදමා උන් වහන්සේ අනුව ගියහ. උන් වහන්සේ එතැනින් මඳ දුරක් ගොස් සෙබදීගේ පුත් ජාකොබ් ද, ඔහුගේ සහෝදර ජොහන් ද ඔරුවක හිඳ දැල් සකස් කරනු දැක, එකෙණෙහි ම ඔවුන් ද කැඳවා වදාළ සේක. ඔව්හු ද තම පිය සෙබදී මෙහෙකරුවන් සමඟ ඔරුවෙහි සිටිය දී ම උන් වහන්සේ අනුව ගියහ

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.